# කුඹුරු නොකර
# කුඹුරට නොබැ

මා දන්නා හිතවතකු මෑතකදී හදිසියේම තදබල ලෙස අසනීප විය. එහිදී ඔහුට උණ සමග ඇඟපත වේදනාව, කකුල් කැක්කුම, මූත්‍රා පිට කිරීමේ අපහසුව, කෑම අරුචිය වැනි අපහසුතා ඇතිවිය. වෛද්‍ය ප්‍රතිකාර සඳහා ගියවිට උණට අදාල හා සාමාන්‍ය මූත්‍රා ආසාදනයට බෙහෙත් දෙන ලදී. දින 3 කට පසු අධික උණ සමග වෙව්ලීම, දහඩිය දමා සිහිසුන් තත්ත්වයකට පත්වීම නිසා රාත්‍රී 10.00 ට පමණ ඔහුව රෝහල් ගත කරන ලදී.

පැය 8 ක පමණ දැඩි පරිශ්‍රමයකින් පසු වෛද්‍යවරු රෝගියාව යථා තත්ත්වයට පත්කර ගන්නා ලදී. ලබාගත් වෛද්‍ය වාර්තා වල සඳහන් වී තිබුණේ ඔහුට "මී උණ" සෑදී ඇති බවයි. රෝගියාගේ රැකියාව අනුව (ආගමික ස්ථානයක නිසා) පවුලේ අය සඳහන් කළේ මී උණ සෑදීමට කිසිසේත් අවස්ථාවක් නැති බවයි. මේ පිළිබඳව වෛද්‍යවරුන් දිගින් දිගට අධ්‍යයනය කළ විට මී උණ ආගමික ස්ථානයකදී වුවද සෑදීමට විශේෂ වූ කරුණ සොයා ගැනීමට හැකිවිය.

පූජනීය ස්ථානයක දවසේ ආගමික කටයුතු වලදී එකතු වන මල් පළතුරු රාත්‍රියට එක ස්ථානයකට එකතු කර පසුදා ඉවත් කරන අතර දැනුවත්ව හෝ නොදැනුවත්ව පළතුරු නිසා මීයන් ගැවසී ඇත. ගැවසුණු මීයන් තැන් තැන්වල මූත්‍රා කිරීමේදී එම මූත්‍රා පැගී එහි තිබූ මී උණ බෝකරන බැක්ටීරියා පාදවලින් ඔහුට ඇතුල් වී ඇත. ආගමික ස්ථානයක් බැවින් වැඩ කරන වේලාවේදී පාවහන් නොපළදින නිසා මෙසේ බැක්ටීරියා ඇතුල්වී ඇති බව වෛද්‍යවරුන්ට පෙනීගොස් ඇත. නමුත් ඔහුට පමණක් මෙම රෝගය සෑදීමට විශේෂ හේතුවක් තිබීද ? ඔහු ඉතා පිරිසිදුව සිටින අයෙකි. ශරීරයේ කිසිදු තැනක තුවාලයක්ද නැත. නමුත් මාගේ හිතවතාගේ පාදවල විලුඹේ උෂ්ණාධික රෝගය නිසා තැන් තැන්වල පැලීම් තිබී ඇති අතර එම ස්ථාන වලින් මී මූත්‍රා සමග බැක්ටීරියා ඇතුල්වී ඇති බවත් රෝගය වැළඳීමට එය හොඳටම ප්‍රමාණවත් බවත් වෛද්‍යවරු පවසා ඇත. බැක්ටීරියාව ඇතුල්වී පැය 1/2 ක් ඇතුළත මුළු ශරීරයටම බලපාන බව වෛද්‍යවරු සඳහන් කර ඇත.

කුඹුරු වැඩ කරන අයට සී සෑමේ අවස්ථාවේ සිට ගොයම් කපන අවස්ථාව දක්වා ඕනෑම අවස්ථාවක ශරීරයේ තුවාලයක් සීරීමක් ඇති විට එතනින් මෙම බැක්ටීරියාව ඇතුල් විය හැක. තවද කුඹුරු වල ක්‍රීඩා කිරීමේදී අවුරුදු උත්සව පැවැත්වෙන විට පාවහන් නොමැතිව ඇවිදීමේදී බැක්ටීරියාව ඇතුල් විය හැකිය.






මේ අනුව කුඹුරු ගොවිතැන් කරන අවස්ථාවන් හැර මෙම බැක්ටීරියා ශරීර ගත විය හැකි අනෙකුත් අවස්ථාද වෛද්‍යවරු පෙන්වාදී ඇත.

උදාහරණ ලෙස :-

» ගෙවත්තේදී (මඩ, පස් සමඟ මිශ්‍ර වූ මී මූත්‍රා ශරීර ගත වීමෙන්)
» පාරේ ගමන් කරන විට එකතුවන වතුර වලවල් වලින්
» කාර්යාල පරිශ්‍රයේ ඇති මිදුලේ, වතුර එකතු වන තැන්වල
» නිවසේ මුළුතැන්ගෙයි මේසය අතින් පිසදාන විට (අත් වලින්)
» මාළු ලැල්ලක හවස වැඩ නිමවීමෙන් පසු, පසුදින එහි වැඩ ආරම්භ කිරීමට එය පිරිසිදු කරන විට (අත් වලින් පිසදාන විට)

මාරාන්තික මී උණ මෙලෙස වැළඳිය හැකි අවස්ථා තේරුම් ගෙන ඉතා ප්‍රවේසම් විය යුතුයි. එමෙන්ම එවැනි රෝග ලක්ෂණ මතුවූ සැනින් මෙවැනි සැක කටයුතු ස්ථාන වල ඔබ ගැවසුනේ නම් ක්ෂණිකව රජයේ රෝහලකට ගොස් ඒ බව වෛද්‍යවරුන්ට නොසඟවා ප්‍රකාශ කර ප්‍රතිකාර ලබාගන්න.

එසේම මෙම බැක්ටීරියාව හාවන්, ඌරන්, ඉත්තෑවන් බල්ලන්, අශ්වයන්, මුගටියන්, ගවයන් සහ බැටළුවන්ගේ ද ඇති බව වෛද්‍යවරු සඳහන් කර ඇත.

*ඔබව දැනුවත් කළේ :*
*එන්. පී. සී. ද සිල්වා,*
*හිටපු අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති),*
*පේරාදෙණිය*